# දඟකාර් හා පැංචාට පාඩමක්



ගිහන්සා රෂිනි රවිහන්සි

# දඟකාර හා පැංචාට පාඩමක්

ගිහන්සා රෂිනි රවිහන්සි

ප්‍රථම මුද්‍රණය : 2025/02/08

කර්තෘ : ගිහන්සා රෂිනි රවිහන්සි

ලිපිනය : නො.36/34,
අම්පිටිය පාර,
තැන්නෙකුඹුර

**ISBN** අංකය : **ISBN 978-624-208-263-9**

මුද්‍රණය

**"UNIQUE CREATIONS"**

නොඃ 43 බී, තැන්නෙකුඹුර,

මහනුවර.

# පිදුම

ජීවිතයට අවබෝධයෙක් ලබා දෙමින්
දැනුමෙන් මා පෝෂණය කරන්නා වූ
මාගේ ආදරණීය ගුරු මැණිවරුන්ටත්
ගුරු පියවරුන්ටත්

සෙවනැල්ලක් සේ මා පසුපස සිට
මා පෝෂණය කර ඇති දැඩි කරන
මාගේ ආදරණීය දෙමව්පියන්ටත්

මා මෙන්ම දැනුම සොයා යන
මාගේ යෙහෙළියන්ටත්
මේ පොත ආදරයෙන් මා පුද කරමි

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතිත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



ඈත ලස්සන කැලෑවක
පුංචි හා පවුලක් ජීවත් වුණා.
හා අම්මායි හා තාත්තායි හා පුතයි.
මේ පවුලේ හිටියා හා පැංචා නම් හරිම
දඟකාරයි හැබැයි එයාලා
හරිම සතුටින් හිටියා.


කැලේ මැද්දට වෙන්න තිබුණ.
ලස්සන මල් වත්තක් පාට පාට
සමනලුන් කුරුල්ලන් මේ මල් වත්තට
ආවා.ලස්සන මල් වර්ග ගොඩක්
මේ මල් වත්තේ  තිබුණා.



හා පැංචා නිතරම මේ මල් වත්තට සෙල්ලම් කරන්න ආවා. එයාගේ සෙල්ලම වුනේ මල් පැණි බොන්න එන සමනලුන්ට කුරුල්ලන්ට කරදර කරන එක.



හා පැංචා කෝටු කෑලි ගල් වලින් ලස්සන සමනලුන්ට කුරුල්ලන්ට පන්න පන්නා ගහනවා. එයාලට කරදර කරලා හා පැංචා ගොඩක් සතුටු වුණා.



කුරුල්ලන්ට සමනලුන්ට හා පැංචාව
හරිම කරදරයක් වෙලයි තිබුණේ
එයාලට මල් පැණි බොන්න මේ මල්
වත්ත විතරයි තිබුණේ
ඉතින් සමනලුන් කුරුල්ලන් හරිම
දුකින් හිටියේ මේ ගැන.





එයාලගේ යාළුවෝ වුණු මී මැසි
යාළුවන්ට හරි හා පැංචාගේ කරදරය
ගැන කියලා හා පැංචාට හොඳ
පාඩමක් උගන්වන්න ඕනි කියලා
කුරුල්ලන්  සහ සමනලුන් කතා වුණා.

ඔන්න ඉතින් හැමෝම එකතු වෙලා
හා පැංචා මල් වත්තට එනකල්
බලාගෙන හිටියා.



ටික වේලාවකින් හා පැංචා
සිංදුවකුත් කියමින් නට නටා
කෝටු කෑලි අතින් අරන්
මල් වත්තට පැන පැන ආවා.






එක පාරටම මී මැසි රංචුව හා
පැංචාට පන්න පන්නා අනින්න ගත්තා.
හා පැංචා බය වෙලා අඬන්න ගත්තා.



අනේ මට රිදෙනවා අනින්න එපා
කියලා හා පැංචා කෑ ගහන්න ගත්තා.
ඔයාට රිදෙනවා වගේම සමනලුන්ටත්
කෝටු කෑලි  ගල් වලින් ගහනකොට
රිදෙනවා.මී මැස්සන් හා පැංචාට කිව්වා.



අනේ මට සමාවෙන්න. මම ආයේ
කවදාවත් එහෙම කරන්නේ නෑ
හා පැංචා අඬ අඬා කිව්වා.



හා පැංචා හොඳ කෙනෙක් වුණා.
එයා යහළුවන් එක්ක සතුටින් මල්
වත්තේ සෙල්ලම් කළා.
කාටවත් ආයේ කරදර කරේ නම් නෑ.

නිමි.





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුලින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්